# 2022 අප්‍රේල් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 අප්‍රේල් මස මාසික සභා රැස්වීම 2022.04.07 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

### නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2022.03.10 වන දින මාසික සභා රැස්වීම් වාර්තාවේ එදින සහභාගී වූ නම් ලැයිස්තුවේ අප අතරින් වියෝ වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමාගේ නමද වැරදීමකින් සඳහන්වී ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් සඳහන් කළාය. එම සංශෝධනයට යටත්ව 2022.03.10 දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

නිවේදන කිසිවක් නොවීය.

3. **<u>සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>**

**3.1. නිවාඩු අනුමත කර ගැනීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

**3.2. මාසික දීමනාවක් ලබා ගැනීම සම්බන්ධවයි.**

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට අයත් මුත්තෙට්ටුපොල සුමඟ පෙර පාසලේ ප්‍රධාන පාලිකාව ලෙස සේවය කරන එස්.පී.කාවින්දි නර්මදා මෙනවිය විසින් තමන් වෙත මේ වන තෙක් කිසිදු ගෙවීමක් සිදු නොකරන බැවින් සභාව මඟින් දීමනාවක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදි.

**3.3. දහම් පාසලට ඩෙස් බංකු සෑදීම සඳහා ගසක් නිදහස් කර ගැනීම සම්බන්ධවයි.**

මිල්ලකඩේ, හුණුවල, ඕපනායක ලිපිනයේ පිහිටි කදලිවනාරාම පුරාණ විහාරස්ථානයේ විහාරාධිකාරී ස්වාමීන් වහන්සේ විසින් එම විහාරස්ථානයේ දහම් පාසල සඳහා මේස පුටු සෑදීමට ගම්මැද්දගම පොදු සුසාන භූමියේ ඇති ගසක් නිදහස් කර දෙන ලෙස ඉල්ලා එවන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

**3.4. බඹරගල සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදි කිරීමට යෝජිත ඉඩම් කොටස රජයට අත්පත් කර ගැනීම.**

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බඹරගල ග්‍රාම නිලධාරී වසමේ ක.සි.620168 කලාප 6 කැබලි අංක 65 දරණ ප්‍රමාණයෙන් රූඩ් 2 පර්චස් 14.2 ක් වන ගල්ලෙනයාය නැමති ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක් වන අතර එම ඉඩමෙන් පර්චස් 15ක ප්‍රමාණයක් බඹරගල සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රජයට අත්පත් කර ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ එකඟතාව ලැබී ඇති අතර ඊට අදාල පළාත් පාලන ආයතනයේද අනුමැතිය අවශ්‍ය බැවින් ඒ සඳහා එකඟතාව ඉල්ලා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද අංක WEDS/LND/9/ACQ/2-12 හා 2022.03.18 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

4. **<u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>**

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය

5. **<u>කල් දී ඇති යෝජනා</u>**

**5.1.** ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. කහවත්ත සීමාසහිත පන්නිල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතියෙන් ඉන්දන ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 02 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කිරිම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවතින ඉන්ධන හිඟය හේතුවෙන් පැල්මඩුල්ල ඉන්ධන පිරවුම්හලේ ඉන්ධන නොමැති බැවින්, කහවත්ත සීමාසහිත පන්නිල්පත්තු විවිධ සේවා සමුපකාර සමිති ඉන්ධන පිරවුම්හලින් ඉන්ධන ලබා ගැනීමට තීරණය කල බවත්,එම ඉන්ධන පිරවුම්හලේ රාජ්‍ය ආයතන වලට වෙනම ඉන්ධන ගබඩා කර ඇති බැවින් ඉන්ධන පවතින බව පැහැදිලි කළේය. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්. කුමාර මැතිතුමා රටේ පවතින ඉන්ධන හිඟයට ඉන්ධන පිරවුම්හල මාරු කිරීම විසඳුමක් නොවන බව ප්‍රකාශ කළේය. කෙසේ වෙතත් සභාවේ ට්‍රැක්ටර් රථ හා කම්පැක්ටර් රථය කසල එකතු කිරීම සඳහා නිරන්තරව යැවිය යුතු බැවින්, ඉන්ධන ලබා ගැනීම සඳහා ඉහත ඇප මුදල තැන්පත් කර කහවත්ත පන්නිල්පත්තු විවිධ සේවා සමුපකාර සමිති ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගැනීම කාලෝචිත බව ගරු සභාපතිතුමා පැහැදිලි කල අතර ඒ අනුව, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. ප්‍රාදේශීය සභාවට විදුලි ජනන යන්ත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී .

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්. සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්. කුමාර මැතිතුමා පවතින ඉන්ධන හිඟය හේතුවෙන් හා රටේ පවතින ආර්ථික තත්වය හේතුවෙන් මෙවැනි මිලදී ගැනීම් දෙවරක් සිතා බලා සිදු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා සියලු මිලදී ගැනීම් හා බඳවා ගැනීම් මෙම කාලසීමාවේදී කල් දැමීම සුදුසු බව ප්‍රකාශ කලේය. ඒ අනුව රටේ තත්වය සලකා බලා ඉහත මිලදී ගැනීම සම්බන්ධව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බැවින් එම යෝජනාව ඉහත අදහස් වලට යටත්ව සභා සම්මත විය.

III. කේ .බී.පී.පෙරේරා මහත්මිය වැඩ ක්ෂේත්‍ර තනතුරට බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්. සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව,පුරප්පාඩුව පවතින වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා ඉහත නම් සඳහන් අය බඳවා ගැනීම සුදුසු බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IV. දේපලක භෞතික තත්ත්වය වෙනස් වීම මත සිදු කෙරෙන තාවකාලික අතුරු ප්‍රතිශෝධන , දේපලක භාවිතය වෙනස්වීම මත සිදු කෙරෙන තාවකාලික අතුරු ප්‍රතිශෝධන සහ දේපල අයිතිය වෙනස්වීම මත සිදු කෙරෙන සංශෝධන සභාව මඟින් සිදු කිරිම අවශ්‍ය බව යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්. කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව සම්බන්ධව පැහැදිලි කල ගරු සභාපතිතුමා,

දේපළක භෞතික තත්ත්වය වෙනස් වීම මත සිදුකරන සංශෝධන ලෙස,

- ගොඩනැගිල්ලක් සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කිරීම.
- ගොඩනැගිල්ලක කොටසක් කඩා ඉවත් කිරීම.
- නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
- ගොඩනැගිල්ලට  කොටසක් එකතු කිරීම.
- හිස් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් කොටස් වලට වෙන් කිරීම.
- දේපල දෙකක් හෝ ඊට වඩා වැඩි ගණනක් එකට ඒකාබද්ධ කර එක දේපලක් ලෙස තක්සේරු කිරීම.

දේපලක භාවිතය වෙනස් වීම මත සිදුකරන සංශෝධනය ලෙස,

- අදාල දේපල දැනට යොදාගනු ලබන නිවැරදි භාවිතය පිළිබඳව සිදුකරන ලද තක්සේරුව.
- දේපල අයිතිය වෙනස් වීම මත සිදුකරනු ලබන සංශෝධන හඳුන්වා දිය හැකි බව ප්‍රකාශ කරන ලදී.

මෙහිදී තව දුරටත් කරුණු පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටියේ දැනට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන දේපල වල අයිතිය වෙනස් වීම සම්බන්ධ ලියවිලි නිසි පරිදි නිවැරදි කර එවීමක් සිදු නොවන බැවින් සභාව දැඩි අපහසුතාවට පත් වී ඇති බවත්,එසේම තම දේපලෙහි අයිතිය පිළිබඳව සභාවේ ලේඛන වල සටහන් ගෙවීම තුල වරිපනම් නොගෙවා සිටීමට ජනතාව පෙලඹී ඇති බවත්,එසේ සභාවට වරිපනම් අයකර ගැනීමේදී දැඩි දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවන බවත්ය.එබැවින් සභාව විසින් එකී දේපල වල නව සංශෝධන කිරීම් සිදු කර එකී සංශෝධන පිළිබඳ තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සුදුසු බවත්ය.
ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

V. ගලි බවුසරයේ ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධනය කිරිම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව,  - අවසාන බැහැරලීම පිටත බවුසර් සඳහා - රු. 2500.00

ප්‍රවාහන ගාස්තු

- ප්‍රතිකාර මධ්‍යස්ථානයේ සිට සෑම කි.මී. එකක් සඳහා - රු. 400.00

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

VI. කාර්යාලයේ අවශ්‍යතා සඳහා සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකුගේ සේවය දිස්ත්‍රික් මිල කමිටු මිලගණන් මත මිලදී ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා අසනීප නිවාඩු ලබා ඇති බැවින් එතුමා විසින් න්‍යාය පත්‍රයට ඉදිරිපත් කල යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

I. හඳගිරිය වනෝද්‍යානය තුළ අතුරු මාර්ග සංවර්ධනය සඳහා J.C.B යන්ත්‍රය ලබා දීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

II. හඳගිරිය වනෝද්‍යානයේ වළවේ ගඟ හරහා උඩවලව වනොද්‍යානයට පාලමක් ඉදි කිරිම සුදුසු බව යෝජනා කරන ලදී.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් කුමාරරත්න මැතිතුමා මෙම පාලම ඉදිකිරීමෙන් පුරාවස්තු වලට කිසිදු හානියක් සිදු නොවිය යුතු බවත්,ඒ ආශ්‍රිතව නිදන් වදුළු ඇති බැවින් ඒවා ආරක්ෂා විය යුතු බවත්, සඳහන් කල අතර මෙහිදී යම් අකටයුත්තක් වන්නේද යන්න ප්‍රදේශවාසීන් නිරන්තර අවධානයෙන් පසුවන බවත් ප්‍රකාශ කළේය.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මෙම පාලම ඉදි කිරීම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත සිදු කරන බවත්, අදාල නිලධාරීන් එම ස්ථාන පරීක්ෂා කර වනජීවී හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ද අනුමැතිය මත සියළු වාර්තා මේ වන විට සකස් කර ඇති බැවින්,සභාවේ අනුමැතිය ලබා ගෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතියද ලබා ගත් පසු මෙම පාලමේ වැඩ ආරම්භ කල හැකි බව සඳහන් කළේය.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- පෙ.ව.10.30 ට ගරු උප සභාපති ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

### 6.1. 2022.03.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ තීරණ අංක 1908 සිට 1946 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 6.2. 2022.03.10 වන දින ප්‍රසම්පාදන වාර්තාව

2022.03.10 වන දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2022 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 813,590.71 | වැටුප් හා දීමනා | 4,302,075.63 |
| කුලී | 165,264.56 | ගමන් වියදම් | 11,450.00 |
| බලපත්‍ර ගාස්තු | 358,250.00 | සැපයුම් හා උපකරණ | 517,133.00 |
| සේවා සඳහා ගාස්තු | 153,429.64 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 69,806.23 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,481.61 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යාක සේවා | 112,412.30 |

| | | | |
|---|---|---|---|
| වෙනත් ආදායම් | 1,046,023.11 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 3,446,030.88 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 5,984,070.51 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 21,755.70 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 5,034,632.86 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 37,000.00 |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 5,984,070.51 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 68,964.67 | සේවක ණය | 505,452.34 |
| තැන්පත් | 497,908.90 | තැන්පත් | 11,807,222.85 |
| අත්තිකාරම් | 10,000.00 | ණයහිමි | 25,000.00 |
| ණය ගැති(කර්මාන්ත) | 12,514,470.44 | අත්තිකාරම් | - |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 13,091,344.01 | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 12,337,675.19 |
| මුළු එකතුව | 19,075,414.52 | මුළු ගෙවීම් | 17,409,308.05 |

### 7.2. 2022 පෙබරවාරි 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා පෙ.ව.11.00ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.
.

## 8. පසු ගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව,ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

සභාවේ ලේකම් තනතුරට පත් වූ නව ලේකම්තුමියට සිය සුභ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමා හිටපු වැඩ බලන ලේකම් එස් රත්නාවතී මැණිකේ මෙනවිය වසර ගණනාවක් පුරා සභාවේ කටයුතු සාර්ථකව සිදු කර ගැනීමට දැක්වූ සහයෝගය අගය කල අතර පුහුණු නිලධාරියෙකු ලෙස තමන් රාජ්‍ය සේවයට ඇතුළත් වූ මුල් අවධියේ දී එතුමියගෙන් විශාල දැනුම් සම්භාරයක් ලබා ගත් බවත්, එම

වකවානුවේ පටන් එතුමිය සභාව වෙනුවෙන් කල සියලු දේ වෙනුවෙන් එතුමියට සිය කෘතවේදී ස්තුතිය පුද කල අතර එතුමියගේ අනාගතය සාර්ථක කර ගැනීමට සුභ පැතුම් එක් කළේය.

වර්තමානයේ රට පත් වී ඇති තත්වයට මෙතෙක් රට පාලනය කල සියලු රජයන් වගකිව යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමා, රටේ ජීවත්වන ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමටවත් නොහැකි ආණ්ඩුවක් අවශ්‍ය නොවන බවත්, මෙවැනි තත්වයක් හමුවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වශයෙන් සියලු දෙනා පාට පක්ෂ භේදයකින් තොරව එක්ව ජනතාව සමඟ ඔවුන් වෙනුවෙන් පෙනී සිටිය යුතු බව පෙන්වා දුන්නේය.

## 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

මහජන මුදලින් දීමනා ලබමින් ජනතාවගේ ගැටළු වෙනුවෙන් පෙනී සිටීමට කැපවූ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මසකට එක් වතාවක් පමණක් පවත්වනු ලබන මාසික සභා රැස්වීමට ද සහභාගි නොවන්නේ නම් ,එය ඉතා කනගාටුවට කරුණක් වන බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, ඔවුන්ගේ මාසික දීමනාවද ලබාදීම සුදුසු නොවන බවත්, ඔවුන් වෙනුවෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු බවත් තරයේ ප්‍රකාශ කළේය.

එසේම පසුගිය කාලයේ ඕපනායක පැවැති බක්මහ මේලා වෙළඳ සැණකෙළියෙන් අදාල පාසලට මුදල් පරිත්‍යාග සිදු වූ බවට විදුහල්පතිතුමාගෙන් ලිපියක් ලබා ගත්තේ ද යන්නත්, ඒ සම්බන්ධව සවිස්තර කරුණු සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවත්, ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලදී. එසේම තමන් විසින් දිගින් දිගටම මෙම සභාවේදී විවිධ අනාවැකි පල කල අතර ඒවා ඒ ආකාරයෙන්ම අද සිදුවෙමින් පවතින බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා, පසුගිය දෙසැම්බර් මස සභා වාරයේ දී තමන් විසින් රටේ ජනතාව පවතින රජයට විරුද්ධව ඉදිරි මාර්තු මාසය වන විට පාරට බසින බවට සිදුකල ප්‍රකාශය ඒ ආකාරයෙන්ම මේ වන විට සිදුවී ඇති බවත් සඳහන් කළේය. මෙසේ ජනතාව පාරට බැස සිදු කරනු ලබන අරගල තවත් ඉදිරියට උත්සන්න වී ජනතාව තවත් පීඩාවට පත් නොකර අදාල පාලකයින් ඉවත් විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

තවද ඉන්ධන මිල ඉහළ යාම, ගෑස් නොමැති වීම අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම ආදිය හේතුවෙන් ජනතාව දැඩි පීඩාවට ලක්වී ඇති අතර ග්‍රාමීය ජනතාවට ගෙවත්තෙන් යම් ප්‍රමාණයකින් හෝ ආහාර සපයාගත හැකි නමුත්, මේ වන විට නාගරික ජනතාව වැඩි ප්‍රමාණයක් කුසගින්නේ ජීවිත ගෙවන අතර තම දරුවන්ගේ කුසගින්න නිවීමට දැඩි වෙහෙසක් ගන්නා බව පැහැදිලි කල ගරු මන්ත්‍රීතුමා මෙම තත්ත්වය උත්සන්න වීමේ දී මිනිසුන් මහමඟ මිය යාමද සිදුවිය හැකි බැවින් එම තත්ත්වය වළක්වා ගැනීමට පාට පක්ෂ භේදයකින් තොරව සියළු දෙනා එක්ව කටයුතු කල යුතු බව සඳහන් කළේය.

## 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් කුමාරරත්න මැතිතුමා සඳහන් කළ ආකාරයට ප්‍රාදේශීය සභා මාසික රැස්වීම් සඳහා සහභාගී නොවන මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් යම් විනය ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත්, ඔවුන්ගේ දීමනා ලබාදීම සම්බන්ධයෙන් තීරණය ගැනීම සුදුසු බවත්, සඳහන් කරමින් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා නව ලේකම්තුමියට සිය සුභ පැතුම් එක්කරමින් හිටපු ලේකම්තුමිය සිදුකර සේවය අගය කළේය.

එසේම රටේ පවතින තත්වය සම්බන්ධයෙන් කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා , ප්‍රාදේශීය දේශපාලනඥයින් වශයෙන් ජනතාව සමඟ සමීප සබඳතා පවත්වන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මේ මොහොතේ දැඩි මානසික පීඩාවකට පත් සිටින බව පැවසූ අතර පාට පක්ෂ භේදයකින් තොරව තමන් ද ජනතාව විඳින දුක් පීඩා දැක ඉතාමත් මානසික පීඩාවකට පත් වී සිටින බවත් රටේ නායකයින්ට ජනතාවගේ මෙම දුක් පීඩා නොපෙනීම ඉතා කනගාටුවට කරුණක් බවත් පැවසුවේය.එසේම දේශපාලන ක්‍රමය පිළිබඳ දැඩි කලකිරීමක් තමන් තුල ඇති බවත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනෙකු ස්වාධීනව කටයුතු කිරීමට ඉදිරිපත් වී ඇති අවස්ථාවක ඔවුන් ගත් තීරණය පිළිබඳව තමන්ගේ කෘතවේදීත්වය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගත් ගරු මන්ත්‍රීතුමා, මෙම අවස්ථාවේදී පක්ෂය කුමක් වුවත් දේශපාලන නායකයින් සිටිය යුත්තේ ජනතාව සමඟ බව පැවසූ අතර මෙවැනි පීඩාකාරී අසීරු අවස්ථාවක කුමන ගැටළු මතු වුව ද තමන් ජනතාව වෙනුවෙන් ජනතාව සමඟ එක්ව සිටින බව සඳහන් කළේය. එසේම ලබන්නා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද ජනතාවගේ දුක් පීඩා මැද ගත කිරීමට සිදු වී ඇති අතර අතීතයේ යුද සමයේදීවත් මෙවැනි තත්වයක් රටට උදා නොවූ බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ජනතාව පත්වී ඇති අසරණ තත්ත්වය රටේ නායකයින්ගේ නෙත ගැටේවායි! ප්‍රාර්ථනා කළේ ය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

නව ලේකම්තුමියට සුභ පැතුම් එක් කරමින් හිටපු ලේකම්තුමිය සභාව වෙනුවෙන් කල සේවය කෘතවේදීව සිහිපත් කල ගරු මන්ත්‍රීතුමා එතුමියට සිය ස්තූතිය පුද කළේය.

එසේම රට තුල උත්ගත වී ඇති තත්වය පිළිබඳව කෙටි කරුණු දැක්වීමක් සිදු කල අතර උඩවෙල සිට අකරැල්ල මාර්ගයේ පළමු කි.මී.3 දැඩි සේ අබලන් වී ඇති බැවින් එය කඩිනමින් පිළිසකර කර දෙන ලෙස පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා ,ප්‍රදේශයේ පවතින කහවත්ත වතු සමාගමට අයත් අකරැල්ල වතුයායේ වගා නොකල ඉඩම් ජනතාවට වගා කටයුතු කිරීම සඳහා ලබාදීමේ වැඩ පිළිවෙලක් සකස් කර දෙන ලෙස දන්වන ලෙස වැඩිදුරටත් ඉල්ලා සිටියේය. අවසානයේ ලබන්නාවූ අලුත් අවුරුද්ද ජනතාවගේ දුක් පීඩා දුරු වූ සුභ නව වසරක් වේවා යි! ගරු මන්ත්‍රීතුමා ප්‍රාර්ථනා කළේය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

වසර ගණනාවක් පුරා සභාවේ ලේකම් තනතුර දැරූ එස්. රත්නාවතී මැණිකේ ලේකම්තුමිය ඉටුකල සේවාව වෙනුවෙන් සිය ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගත් ගරු මන්ත්‍රීතුමා එතුමියගේ අනාගතය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි! ප්‍රාර්ථනා කරමින් නව ලේකම් තනතුරට පත්වූ නව ලේකම්තුමියෙට සභාවේ කටයුතු ඉදිරියට සාර්ථකව කරගෙන යාම සඳහා සුභ පැතුම් එක් කලාය.

එසේම, රටේ පවතින තත්වය ඉතාමත් කණගාටුදායක බවත්, පවතින ආර්ථික අපහසුතා කාන්තාවන්ට විශාල ලෙස දැනෙන බවත් පැවැසූ ගරු මන්ත්‍රීතුමිය ඒ සම්බන්ධව වැඩිදුර අදහස් දැක්වීම ඵලරහිත බව පැවසීය.තම පක්ෂයේ නව කණ්ඩායම් නායක ධූරයට පත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් කුමාරරත්න මැතිතුමාට සභාවේ හිමිවිය යුතු ස්ථානය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් වැඩිදුරටත් ඉල්ලා සිටින ලදී.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

නව ලේකම්තුමියට සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාමට සුභ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමා හිටපු ලේකම්තුමිය සුහදව සියළු දෙනා සමඟ සහයෝගයෙන් සභාවේ දියුණුව වෙනුවෙන් කැපවී

සේවය කල ඉතාමත් නිහතමානී රාජ්‍ය සේවකයෙකු වූ බවත්, එතුමිය ඉටු කල සේවාව අගයමින් අනාගතය වෙනුවෙන් සුභ පැතුම් එක් කළේය.

තවද, රටේ පවතින ආර්ථික අර්බුදයට යම් ප්‍රමාණයකින් හෝ විසඳුමක් ලබාගැනීමට නම් ග්‍රාමීය මට්ටමින් විශේෂ දක්ෂතා ඇති පෙදරේරු, වඩු ශිල්පී, හා විදුලි කාර්මික ආදී දැනුම් සහිත පුද්ගලයින් රැසක් සිටින අතර ඔවුන් හඳුනාගෙන විදේශ රැකියා අවස්ථා ලබාදීමේ වැඩසටහනක් දියත් කල යුතු අතර ඒ තුලින් රටේ පවතින ඩොලර් හිඟයට යම් විසඳුමක් ලබා ගත හැකි බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා ලබන්නා වූ අලුත් අවුරුද්ද අනේකවිධ දුක් පීඩා මැද්දේ වුවද සියළු දෙනාට චාරිත්‍ර වාරිත්‍ර සිදු කිරීමටවත් හැකිවන සුභ අලුත් අවුරුද්දක් වේවායි! ප්‍රාර්ථනා කළේය.

## සභා රැස්වීමේ නිමාව

සභාවේ හිටපු ලේකම්තුමිය වන එස්.රත්නාවතී මැණිකේ ලේකම්තුමිය දීර්ඝ කාලයක් මෙම සභාවේ සේවය යෙදී සිටි අතර එතුමිය විශාල කාර්යභාරයක් සභාව වෙනුවෙන් සිදුකල බවත් සභාවේ සියළු කාර්යයන් සඳහා විශාල කැපවීමකින් සිය සේවය ඉටු කල බවත් පැවසූ ගරු සභාපතිතුමා, එතුමිය සභාව වෙනුවෙන් ඉටුකල සේවය වෙනුවෙන් සිය කෘතවේදී ස්තූතිය ප්‍රකාශ කල අතර එතුමියගේ අනාගතයට සුභ පැතුම් එක් කලේය. එසේම සභාවට පත් වූ නව ලේකම්තුමිය බළන්ගොඩ නගර සභාවේ සේවය යෙදී සිටිමින් විශාල කාර්යභාරයක් ඉටු කරමින් ඉටුකල සේවය අගය කල අතර මෙම සභා වෙනුවෙන් ද ඉදිරි වැඩ කටයුතු සිදුකිරීමට එතුමියට සියලු දෙනාගේ සහය ලබා දෙන බවත්, එතුමියගේ සහයෝගයෙන් සභාවේ කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යාමට හැකිවෙනු ඇති බවත් ගරු සභාපතිතුමා සඳහන් කළේය.

එසේම රටේ පවතින තත්ත්වය සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා අතීතයේ ද මෙවැනි අර්බුදකාරී තත්ත්වයන් ඇති වී ඇති බවත්, මෙවැනි තත්ත්වයන් තුල ජනතාව හා පාලකයින් ඉතා බුද්ධිමත්ව කටයුතු කල යුතු බවත් ප්‍රකාශ කල අතර යම් ආර්ථික අර්බුදයක් රට තුල මෙන්ම මුළු ලෝකයේම පවතින බැවින් ක්‍රමයෙන් මෙම ගැටළු විසඳිය යුතු බව පැවසුවේය. ජනතාව සමග ඍජු සබඳතා පවත්වන මහජන නියෝජිතයින් ලෙස මෙම ගැටලුව තුලින් පීඩාවට පත්වූ ජනතාව තමන් සමග නිරන්තරයෙන් ගැටෙන බැවින් ඔවුන්ගේ දුක් පීඩා විසඳීමට හැකි සෑම ආකාරයකින් ම කටයුතු කරන බව සඳහන් කල ගරු සභාපතිතුමා , අද දින රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකරමින් පෙ.ව. 11.45 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව